ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 ජූලි මස 31 වන දින |


## කො.පා.මි.ද මත පදනම් වූ උද්ධමනය 2020 ජූලි මාසයේ දී ඉහළ යන ලදී


**මතුපිට උද්ධමනය**

ලක්ෂ්‍යමය උද්ධමනය : 4.2%
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.8%
මාසික වෙනස : 0.1%

**මූලික උද්ධමනය**

ලක්ෂ්‍යමය උද්ධමනය : 3.2%
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.0%
මාසික වෙනස : 0.2%




කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100)[1] ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 ජූනි මාසයේ පැවති සියයට 3.9හි සිට 2020 ජූලි මාසයේ දී සියයට 4.2 දක්වා ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම් සහ 2019 ජූලි මාසයේ පැවති පහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2020 ජූනි මාසයේ පැවති සියයට 10.0හි සිට 2020 ජූලි මාසයේ දී සියයට 10.9 දක්වා ඉහළ ගියේය. තවද, ආහාර නොවන කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය ද 2020 ජූනි මාසයේ පැවති සියයට 1.4හි සිට 2020 ජූලි මාසයේ දී සියයට 1.5 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන කො.පා.මි දර්ශකයෙහි වෙනස ද, 2020 ජූනි මාසයේ පැවති සියයට 4.7හි සිට 2020 ජූලි මාසයේ දී සියයට 4.8 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

2020 ජූලි මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 0.1ක් ලෙස වාර්තා වූ අතර ආහාර නොවන කාණ්ඩයේ අයිතමයන්හි දක්නට ලැබුණු මිල වෙනස්වීම්වල ශුද්ධ බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. 2020 ජූලි මාසයේ දී ආහාර නොවන කාණ්ඩයෙහි, සෞඛ්‍ය (පෞද්ගලික රෝහල්/ සාත්තු නිවාස ගාස්තු) උපකාණ්ඩයෙහි අයිතමවල මිල ගණන් ඉහළ ගියේය. මේ අතර, ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි ද සුළු ඉහළ යෑමක් 2020 ජූලි මාසයේ දී වාර්තා විය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන මූලික උද්ධමනය, 2020 ජූනි මාසයේ පැවති සියයට 3.1හි සිට 2020 ජූලි මාසයේ දී සියයට 3.2ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2020 ජූනි මාසයේ දී පැවති සියයට 4.2හි සිට 2020 ජූලි මාසයේ දී සියයට 4.0 දක්වා තවදුරටත් පහළ ගිය අතර, එය මාස දහසයකින් වාර්තා වූ අවම අගයයි.

## දත්ත ඇමුණුම

### සංඛ්‍යා සටහන 01 : කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2018 | ජනවාරි | 122.8 | 125.6 | -0.1 | 0.6 | 5.8 | 3.5 | 6.6 | 5.6 |
| | පෙබරවාරි | 121.9 | 125.8 | -0.7 | 0.2 | 4.5 | 3.5 | 6.4 | 5.3 |
| | මාර්තු | 121.4 | 125.9 | -0.4 | 0.1 | 4.2 | 3.4 | 6.1 | 5.0 |
| | අප්‍රේල් | 121.5 | 126.2 | 0.1 | 0.2 | 3.8 | 3.5 | 5.9 | 4.7 |
| | මැයි | 122.9 | 126.4 | 1.2 | 0.2 | 4.0 | 3.2 | 5.7 | 4.5 |
| | ජූනි | 125.4 | 127.0 | 2.0 | 0.5 | 4.4 | 3.4 | 5.6 | 4.4 |
| | ජූලි | 125.8 | 127.3 | 0.3 | 0.2 | 5.4 | 3.9 | 5.6 | 4.3 |
| | අගෝස්තු | 125.8 | 127.5 | 0.0 | 0.2 | 5.9 | 3.7 | 5.6 | 4.1 |
| | සැප්තැම්බර් | 124.9 | 128.0 | -0.7 | 0.4 | 4.3 | 3.8 | 5.4 | 3.9 |
| | ඔක්තෝබර් | 124.6 | 128.1 | -0.2 | 0.1 | 3.1 | 3.8 | 5.0 | 3.8 |
| | නොවැම්බර් | 126.2 | 128.9 | 1.3 | 0.6 | 3.3 | 3.4 | 4.6 | 3.6 |
| | දෙසැම්බර් | 126.3 | 128.8 | 0.1 | -0.1 | 2.8 | 3.1 | 4.3 | 3.5 |
| 2019 | ජනවාරි | 127.4 | 132.5 | 0.9 | 2.9 | 3.7 | 5.5 | 4.1 | 3.7 |
| | පෙබරවාරි | 126.8 | 132.6 | -0.5 | 0.1 | 4.0 | 5.4 | 4.1 | 3.8 |
| | මාර්තු | 126.6 | 133.0 | -0.2 | 0.3 | 4.3 | 5.6 | 4.1 | 4.0 |
| | අප්‍රේල් | 127.0 | 133.1 | 0.3 | 0.1 | 4.5 | 5.5 | 4.1 | 4.2 |
| | මැයි | 129.0 | 134.2 | 1.6 | 0.8 | 5.0 | 6.2 | 4.2 | 4.4 |
| | ජූනි | 130.2 | 134.4 | 0.9 | 0.1 | 3.8 | 5.8 | 4.2 | 4.7 |
| | ජූලි | 130.0 | 134.6 | -0.2 | 0.1 | 3.3 | 5.7 | 4.0 | 4.8 |
| | අගෝස්තු | 130.1 | 134.6 | 0.1 | 0.0 | 3.4 | 5.6 | 3.8 | 5.0 |
| | සැප්තැම්බර් | 131.1 | 135.2 | 0.8 | 0.4 | 5.0 | 5.6 | 3.9 | 5.1 |
| | ඔක්තෝබර් | 131.3 | 135.2 | 0.2 | 0.0 | 5.4 | 5.5 | 4.0 | 5.3 |
| | නොවැම්බර් | 131.7 | 135.5 | 0.3 | 0.2 | 4.4 | 5.1 | 4.1 | 5.4 |
| | දෙසැම්බර් | 132.4 | 135.0 | 0.5 | -0.4 | 4.8 | 4.8 | 4.3 | 5.5 |
| 2020 | ජනවාරි | 134.6 | 136.5 | 1.7 | 1.1 | 5.7 | 3.0 | 4.5 | 5.3 |
| | පෙබරවාරි | 134.6 | 136.9 | 0.0 | 0.3 | 6.2 | 3.2 | 4.6 | 5.1 |
| | මාර්තු | 133.4 | 136.9 | -0.9 | 0.0 | 5.4 | 2.9 | 4.7 | 4.9 |
| | අප්‍රේල් | 133.6 | 137.2 | 0.1 | 0.2 | 5.2 | 3.1 | 4.8 | 4.7 |
| | මැයි | 134.2 | 138.1 | 0.4 | 0.7 | 4.0 | 2.9 | 4.7 | 4.4 |
| | ජූනි | 135.3 | 138.6 | 0.8 | 0.4 | 3.9 | 3.1 | 4.7 | 4.2 |
| | ජූලි | 135.4 | 138.9 | 0.1 | 0.2 | 4.2 | 3.2 | 4.8 | 4.0 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව